දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின்-அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය
எனது இல.
My No.
PSC/APL/07/100/2025

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2026.03.24

ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

**2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**

**ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය**

උක්ත කරුණට අදාළව යොමු කරන ලද ඔබගේ අංක MSVRI/ADM/16/13/02/2022 හා 2026.02.23 දිනැති ලිපිය හා බැඳේ.

02) ඒ අනුව ඉහත සඳහන් සේවාවේ නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

03) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05) එසේම ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරීන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන ඉල්ලීම් හා ඒ සම්බන්ධයෙන් වන නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# වාර්ෂික ස්ථාන මාරු අභියාචනා තීරණ - 2026
## ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය

| අනු අංකය | නිලධාරියා නම හා තනතුර | වර්තමාන සේවා ස්ථානය | නව සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|
| 1 | වී.ඊ. නිර්මලන් මයා, උපදේශක (පරිගණක) | යාපනය කාර්මික විද්‍යාලය | වව්නියාව කාර්මික විද්‍යාලය | අභියාචනයට ඉඩ ලබා දෙමින් ස්ථානමාරුව අවලංගු කිරීම |
| 2 | ඩී.එම්.එන්.ඩී. දසනායක මිය, උපදේශක (ගොඩනැගිලි) | වරකාපොල කාර්මික විද්‍යාලය | - | අභියාචනයට ඉඩ ලබා දෙමින් කුරුණෑගල තාක්ෂණික විද්‍යාලය වෙත ස්ථානමාරු කිරීම |
| 3 | කේ.එම්.ජේ.බී. කුලසේකර මයා, උපදේශක (ඉංග්‍රීසි) | පාතදුම්බර කාර්මික විද්‍යාලය | දඹුල්ල කාර්මික විද්‍යාලය | අභියාචනයට ඉඩ දෙමින් මහනුවර තාක්ෂණ විද්‍යාලය ලෙස ස්ථානමාරුව සංශෝධනය කිරීම |
| 4 | කේ.වී. මදුරප්පෙරුමආරච්චි මයා, උපදේශක (වානිජ) | මරදාන කාර්මික විද්‍යාලය | ගම්පහ කාර්මික විද්‍යාලය | අභියාචකගේ ඉල්ලීම දැනටමත් ක්‍රියාත්මක වී ඇත. |
| 5 | ඩී.එම්.ජී.එල්. දිසානායක මයා, උපදේශක (වානිජ) | මහනුවර කාර්මික විද්‍යාලය | කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය | අභියාචනයට ඉඩ ලබා දෙමින් ස්ථානමාරුව අවලංගු කිරීම |

2026.03.10